

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | CSS/7/5/6/1 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2015.05. 27 |

ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 03-2015

දකුණු පළාතේ සියළුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා
ගණන් දීමේ නිලධාරීන් වෙත.

<u>විශ්‍රාම පාරිතෝෂික ගෙවීම</u>

ඉහත කරුණ සම්බන්ධව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කර ඇති 2014.09.03 දිනැති අංක 01/2014 දරණ චක්‍රලේඛය සම්බන්ධයෙනි.(එම චක්‍රලේඛයේ පිටපතක් මේ සමඟ අමුණා එවමි.)

02. රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගනු ලබන විශ්‍රාමිකයින්ගේ පාරිතෝෂික ගෙවීම කඩිනම් කිරීම යටතේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් 2014 වර්ෂයේදී රාජ්‍ය බැංකු හරහා විශ්‍රාමිකයින්ගේ බැංකු ගිණුමෙන් පාරිතෝෂික මුදල් ප්‍රේෂණය කිරීමේදී එදිනට අයවිය යුතු අවකරණ මුදල් අයකර ගෙන නොමැති අවස්ථා අනාවරණය වී ඇත.

03. එබැවින් ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනය හා ඒ යටතේ ඇති කාර්යාල වල විශ්‍රාමිකයින්ගේ පාරිතෝෂික මුදලින් අයවිය යුතු අවකරණ මුදල් මේ දක්වා අයකර ගෙන නොමැති නම් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2014.09.03 දිනැති චක්‍රලේඛ ලිපි අංක 01/2014 හි සඳහන් උපදෙස් පරිදි කටයුතු කර නොපමාව අයකර ගැනීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

04. රජයට අයවිය යුතු මුදල් අයකර ගැනීමේ වගකීම ඔබ වෙත පැවරෙන බැවින් මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කර කඩිනම් පියවර ගන්නා ලෙසද වැඩිදුරටත් දැනුම් දෙමි.

ඩබ්ලිව්.කේ.කේ.අතුකෝරල
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත් :

01. සහකාර විගණකාධිපති, දකුණු පළාත : දැ.ගැ.ස.
02. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් : දැ.ගැ.ස.
03. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත් සභාව : අයකිරීම් පිළිබඳව පරීක්ෂා කර බැලීමට
04. ගිණුම් හා ගෙවීම් අධ්‍යක්ෂ, දකුණු පළාත් සභාව : දැ.ගැ.ස.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343
කාර්යාලය / காரியாலயம் / Office 091 2234052, 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299
විද්‍යුත් තැපෑල / மின்-அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம்: / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස් එච්.දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"විශිෂ්ටත්වයෙන් ① ට එන යහපාලනයක්"

චක්‍රලේඛ ලිපි අංක 01/2014

මගේ අංකය: විවැ/චක්‍රලේඛ ලිපි/2014
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.
2014- 09 - 3.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්/ ත්‍රිවිධ හමුදාපතිවරුන්,
ප්‍රාදේශිය ලේකම්වරුන් වෙත.

**විශ්‍රාම පාරිතෝෂික ගෙවීම.**

රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගනු ලබන විශ්‍රාමිකයින් වෙනුවෙන් පාරිතෝෂික ගෙවීම කඩිනම් කිරීම සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයෙන් සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ලද උපදෙස් අනුව රාජ්‍ය බැංකු හරහා විශ්‍රාමිකයින්ගේ බැංකු ගිණුම් වෙත පාරිතෝෂික මුදල් ප්‍රේෂණය කිරීමට අවශ්‍ය පියවර ගෙන හිඟව පැවති විශ්‍රාම පාරිතෝෂික ගෙවා අවසන් කර ඇති බව සතුටින් දැනුම් දෙමි.

**02.** ඉහත පරිදි පාරිතෝෂික ගෙවීමේදී විශ්‍රාමිකයින්ගේ අවකරණ පිළිබඳ තොරතුරු නිසි පරිදි නොලැබීම හේතුවෙන් විශ්‍රාමිකයින්ට අවකරණ රහිත විශ්‍රාම පාරිතෝෂික මුදල් ප්‍රේෂණය වූ අවස්ථා අනාවරණය වී ඇත.

**03.** එවැනි අවස්ථා සම්බන්ධයෙන් පහත පරිදි ක්‍රියා කරන ලෙස කාරුණිකව දන්වමි.

(අ) විශ්‍රාම ගනු ලැබූ නිළධරයන්ගේ සම්පූර්ණ අවකරණ විස්තර මවෙත ඉදිරිපත් කිරීම.

(ආ) රජයට අය විය යුතු අයවීම් පිළිබඳව විශ්‍රාමිකයා දැනුවත් කර වැඩිපෙයන් ගෙවා ඇති අවකරණයන්හි වටිනාකම ආපසු ගෙවන ලෙසට දැනුම් දීම.

(ඇ) ඉහත 'ආ' පරිදි කටයුතු කල පසුවත් අවකරණ අයකර ගැනීමට නොහැකි වූ විශ්‍රාමිකයන්ගේ තොරතුරු මවෙත ඉදිරිපත් කිරීම.

එස්.එස්. හෙට්ටිආරච්චි
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් : 01. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

02. විගණකාධිපති